**කෘෂිකාර්මික අංශය නවීකරණ සඳහා වූ ව්‍යාපෘතිය - 02 කොටස - 2021**

**---------------------------------------------------------------------------**

කෘෂිකාර්මික අංශය නවීකරණ සඳහා වූ ව්‍යාපෘතිය- 02 කොටසේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2017 ජනවාරි 17 දින එළඹි අංක 5873 එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ උපලේඛණ 02හි II වගන්තියේ ආ.3 සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

**---------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, කෘෂිකර්ම අමාත්‍යාංශය කෘෂිකාර්මික අංශය නවීකරණ සඳහා වූ ව්‍යාපෘතියේ 02 කොටස ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. යාපනය, මුලතිව්, අනුරාධපුරය, මඩකලපුව, මොණරාගල, මාතලේ සහ පොළොන්නරුව දිස්ත්‍රික්කවල කෘෂි ඵලදායීතාවය ඉහළ නැංවීම, වෙළඳපොළ ප්‍රවේශයන් වැඩිදියුණු කිරීම සහ සුළු පරිමාණ ගොවීන්ගේ හා කෘෂි ව්‍යාපාර මගින් කෙරෙන අගය එකතු කිරීම් වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. තවද, තරඟකාරී සහ අලෙවිකළ හැකි භාණ්ඩ නිපදවීමට, වෙළඳපොළ අවශ්‍යතා සඳහා ඔවුන්ගේ හැකියාව වැඩිදියුණු කිරීම සහ වාණිජකරණය දෙසට ගමන් කිරීම යන කටයුතු සඳහා සුළු පරිමාණ ගොවීන්ට සහයවීම කෘෂිකාර්මික අංශය නවීකරණ සඳහා වූ ව්‍යාපෘතියේ 02 කොටස යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. මූල්‍ය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 9,175.88 කට සමාන එජඩො මිලියන 64.87ක් සැපයීම සඳහා ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. ඊට අමතරව නුවර, අම්පාර, කිලිනොච්චි සහ වවුනියා යනාදි වෙනත් දිස්ත්‍රික්කවල කටයුතු ක්‍රියාත්මක කිරීමට යුරෝපා කොමිෂන් භාර අරමුදලින් රු.මිලියන 5,040කට සමාන යුරෝ මිලියන 25ක් ලැබී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2017 ජනවාරි 01 දින ආරම්භ කරන ලද අතර 2021 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට සැලැසුම් කර තිබුණි.

**1.3 මතය**

**------**

ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

**--------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

**---------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

----------------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශනමාවංචා හා වැරදි නිසා ඇතිවන ප්‍ර, ණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේමිත ලංකා විගණන ප්‍රශ්‍රී,සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්. මාණාත්මකරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රකාප්‍රසාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත මාණාත්මකවංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍ර. අවප්‍රකාශයන් ඇති විය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ .

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට,ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ.ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර,දුස්සන්ධානය,ව්‍යාජ ලේඛණ සැකසීම,චේතනාන්විත මඟ හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල කළමනාකරණය විසින් කරන ලද සාධාරණත්වය හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කල අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධින් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව අගයන ලදි.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

## 2. භෞතික කාර්යසාධනය

----------------------------

## 2.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබද භෞතික හා මූල්‍ය ප්‍රගතිය

-------------------------------------------------------------

ව්‍යාපෘතියේ කටයුතු සංරචක 5ක් යටතේ ක්‍රියාත්මක වේ. එනම්,

(අ) නවීන කෘෂි තාක්ෂණික උද්‍යාන පිහිටුවීම

(ආ) විශ්ලේශණ සහ ප්‍රතිපත්ති උපදේශන සහය ලබාදීම

(ඇ) ගොවි පුහුණුව හා ධාරිතාවය වර්ධනය කිරීම

(ඈ) නිෂ්පාදන සහ අලෙවිකරණ යටිතල පහසුකම් සැපයීම

(ඉ) ව්‍යාපෘති කළමනාකරණය, නියාමනය සහ ඇගයීම

ව්‍යාපෘති ප්‍රදේශවල කෘෂි ඵලදායීතාවය ඉහළ නැංවීම, වෙළඳපොළ ප්‍රවේශයන් වැඩිදියුණු කිරීම සහ සුළු පරිමාණ ගොවීන්ගේ හා කෘෂි ව්‍යාපාර මගින් කෙරෙන අගය එකතු කිරීම් වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ඒ අනුව ව්‍යාපෘතියේ සමස්ථ අරමුණ වනුයේ ගොවීන් ශක්තිමත් කිරීම, රැකියා නිර්මාණය, නවීන කෘෂිකර්මාන්තය වෙත තරුණයින් ආකර්ෂණය කර ගැනීම වේ. ශ්‍රී ලංකා රජය විසින් ණය නියෝජිතායතනය වෙත පොළී ගාස්තු ලෙස එකතුව රු.මිලියන 302.9ක් ගෙවා තිබුණද මූලික ව්‍යාපෘති අරමුණු පසුව වෙනස්වී තිබුණු බව නිරීක්ෂණය විය. පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| සංරචකය | ක්‍රියාකාරකම් | විගණන ගැටලු | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) නවීන කෘෂි තාක්ෂණික උද්‍යාන පිහිටුවීම | දිස්ත්‍රික්ක 07හි නවීන කෘෂිතාක්ෂණික ආදර්ශ උද්‍යාන 07ක් සැලසුම් කිරීම, ස්ථාපනය, ක්‍රියාත්මක කිරීම, කළමනාකරණය කිරීම සහ භාරදීම | ව්‍යාපෘති පරිපාලන ලියවිලි සහ උපදේශකවරයාගේ යොමුගත කොන්දේසිවල සඳහන් පරිදි ඉහළ වටිනාකමක් සහිත නිෂ්පාදන හෝ විවිධත්වයෙන් යුතු නව නිෂ්පාදන ගොවීන් වෙත හඳුන්වාදී නොතිබුණි. ඒ වෙනුවට කෙසෙල්, අඹ, පේර, අන්නාසි සහ මිරිස් වැනි භෝග වගාකිරීම සඳහා තෝරාගෙන තිබුණි. කෙසේවෙතත්, අනුමත යෝජිත තාක්ෂණය ශ්‍රී ලංකාව සඳහා අලුත් නොවුණු අතර 2022 මාර්තු 01 විගණිත දින වන විටත් ජාත්‍යන්තර වෙළෙඳපොලක් හඳුන්වා දී නොතිබුණි. | ශක්‍යතා අධ්‍යනයේදී ජාත්‍යන්තර සේවා සපයන්නා වෙළඳපොල නැඹුරු ඉහළ වටිනාකමක්, ඉහළ ඵලදායීතාවක් සහිත, ආර්ථිකමය වාසිදායක භෝග හඳුනාගෙන ඇති අතර තොරාගත් භෝග කාණ්ඩ සඳහා තෝරාගත් ප්‍රදේශවල වගා කිරීමට අපේක්ෂිත විය. නැවුම් සහ වටිනාකම් එකතු කළ නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර වෙළඳපොලෙහි ඉහළ යන ඉල්ලුමක් පවතින නිසා ඉහළ වටිනාකමක් සහිත භෝගයක් ලෙස නිවර්තන පළතුරු වර්ග හඳුනාගෙන තිබුණි. | ව්‍යාපෘතියේ අරමුණු ළඟාකර ගැනීමට ව්‍යාපෘති ඇගයීම් ලේඛණවල සඳහන් අරමුණු සමඟ අනුගත වීමට පියවර ගත යුතුය. |
| (ආ) විශ්ලේශණ සහ ප්‍රතිපත්ති උපදේශන සහය ලබාදීම | ප්‍රතිපත්ති සංවර්ධනය | එකතුව රු.මිලියන 624.67කට සමාන එ.ජ.ඩො මිලියන 4.28ක් ප්‍රතිපත්ති සම්පාදනය සංරචකය යටතේ වෙන්කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 69.55කට කොන්ත්‍රාත් 08ක් උපදේශන සමාගම් වෙත පිරිනමා තිබුණු අතර 2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 65.58 ක් ගෙවා තිබුණි. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය අවසාන විට ඒ සඳහා වන අවසන් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | විශ්ලේෂණාත්මක සහ ප්‍රතිපත්ති උපදේශන සහය පිළිබඳ අවසන් වාර්තාව ලැබී තිබෙන අතර ඇල්මැති පාර්ශවයන් සමඟ මෙම වාර්තාවල ප්‍රතිඵල සාකච්ඡා කිරීමට ප්‍රතිපත්ති වැඩමුළුවක් පැවැත්වීමට සැලසුම් කරමින් පවතී. මෙම උප සංරචකය යටතේ එ.ජ.ඩො මිලියන 4.2ක් වෙන්කර තිබුණද, එය පසුව එ.ජ.ඩො මිලියන 1.0ක් දක්වා සංශෝධනය කර ඇත. | මේ සම්බන්ධව වගකිව යුතු පාර්ශවයන් දැනුවත් කිරීමට සහ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) ගොවි පුහුණුව හා ධාරිතාවය වර්ධනය කිරීම | ගොවි පුහුණුව | පසුගිය වර්ෂවල පුහුණු වැඩසටහන්වල ගොවි පුහුණු සඳහා රු. මිලියන 50.2ක් වැයකර තිබුණද, එය අපේක්ෂිත පරිදි නිමකර නොතිබුණි. තවද, 2022 ජනවාරි 03 විගණිත දින වන විටත් ජාත්‍යන්තර සේවා සපයන්නා යටතේ ගොවි පුහුණු වැඩසටහන් ආරම්භ කර නොතිබුණි. | ගොවි ව්‍යාපාර පාසල් පුහුණුව නියමු ගොවි කණ්ඩායම් සඳහා පවත්වා තිබුණු අතර එම වැඩසටහන්වල දිනකට පැය තුන බැගින් සැසි 31ක් ඇතුළත් විය. එම සැසි 31 නිමකිරීමේ අරමුණින් භෞතික පුහුණු වැඩසටහන් පවත්වා ඇත. දින 31ක දිගු කාලයක් වීම හේතුවෙන් දුර්වල පැමිණීම සහ වෙනත් සාමාජිකයින් සහභාගීවන බව මෙම සැසිවලදී දැනගන්නට ලැබුණි. | කොන්ත්‍රාත් ගිවිසුමේ අවශ්‍යතා සමඟ අනුකූල වීමට ජාත්‍යන්තර සේවා සපයන්නා පෙළඹවීමට පියවර ගැනීම අවශ්‍යය වේ. |
| (ඈ) නිෂ්පාදන සහ අලෙවිකරණ යටිතල පහසුකම් සැපයීම | නිෂ්පාදන සහ අලෙවිකරණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ පුනරුත්ථාපනය කිරීම | ජාත්‍යන්තර සේවා සපයන්නෙකු බඳවා ගැනීමේ ප්‍රමාදයන් හේතුවෙන් නියමු ව්‍යාපෘති ප්‍රදේශවල ග්‍රාමීය මාර්ග, ග්‍රාමීය ටැංකි, වගා ළිං සහ ගබඩා පහසුකම් පුනරුත්ථාපන සඳහා එකතුව එ.ජ.ඩො මිලියන 6.15ක් වැය කර තිබුණි. කෙසේවෙතත්, 2022 ජනවාරි 03 විගණිත දින වන විටත් නවීන කෘෂි තාක්ෂණික ආදර්ශ උද්‍යාන යටතේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. | නිෂ්පාදන සහ වෙළඳපොල යටිතල පහසුකම් උප සංරචක 2.3යටතේ ව්‍යාපෘති ඇගයීම් ලියවිල්ලෙහි ප්‍රධාන කටයුතු 3ක් සඳහන් වේ. කුඩා පරිමාන වාරි යටිතල පහසුකම් සහ පවතින ජල ටැංකි සහ වාරිමාර්ග පද්ධති වැඩිදියුණු කිරීම හා පුනරුත්ථාපනය, තෝරාගත් නිෂ්පාදන සහ වෙළඳපොල ප්‍රවේශ මාර්ග වැඩිදියුණු කිරීමට සහ නව ක්ෂේත්‍ර ප්‍රවේශ මාර්ග ඉදිකිරීම වේ. | ව්‍යාපෘතියේ අරමුණු ලඟාකර ගැනීමට ව්‍යාපෘති ඇගයීම් ලේඛණවල සඳහන් අරමුණු සමඟ අනුගත වීමට පියවර ගත යුතුය. |

## 2.2 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන ගැටලුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ------------------ | -------------------- | ---------------------- |
| (අ) කෘෂි තාක්ෂණික ආදර්ශ උද්‍යාන සඳහා උපදේශන සේවා සැපයීමේ කොන්ත්‍රාත්තුව 2019 ඔක්තෝබර් 16 දින රු.මිලියන 271.94කට සමාන එ.ජ.ඩො මිලියන 4.09ක ඇස්තමේන්තුගත පිරිවැයකට පිරිනමා තිබුණු අතර 2021 දෙසැම්බර් 31 දින වන විට නිමකිරීමට අපේක්ෂි විය. කෙසේවෙතත්, 2022 ජනවාරි 05 විගණිත දින වන විටත් එය නිමකර නොතිබුණු අතර 2021 දෙසැම්බර් 31 දිනට ඒ සඳහා එකතුව රු.මිලියන 183ක් ගෙවා තිබුණි. පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |

| | | | |
|---|---|---|---|
| (i) | පරිච්ඡේද ඕ හි 29වන කොටසේ 29වන උප වගන්තිය අනුව මුළු කොන්ත්‍රාත් කාලය සඳහා ප්‍රධාන ජාත්‍යන්තර උපදේශකවරු හතර දෙනකු සහ දේශීය උපදේශකවරු දෙදෙනෙකු සේවයේ යෙදවීමට එකඟවී තිබුණි. කෙසේවෙතත්, කොන්ත්‍රාත්කරු කණ්ඩායම් නායක ලෙස 2019 සිට 2022 ජනවාරි දක්වා කාලපරිච්ඡේදය තුළ එක ජාත්‍යන්තර උපදේශකවරයෙකු පමණක් සේවයේ යොදවා තිබුණි. | කොවිඩ් 19 තත්ත්වය හේතුවෙන් පනවන ලද දේශීය හා ජාත්‍යන්තර ගමන් සීමා මෙම ගැටළුව සඳහා ප්‍රධාන සාධකය විය. | කොන්ත්‍රාත් ගිවිසුමේ අවශ්‍යතා සමඟ අනුකූල වීමට ජාත්‍යන්තර සේවා සපයන්නා පෙළඹවීමට පියවර ගැනීම අවශ්‍ය වේ. |
| (ii) | ඉහත ප්‍රධාන කාර්ය මණ්ඩලයට අමතරව මෙම කොන්ත්‍රාත් ගිවිසුම යටතේ ව්‍යාපෘති ප්‍රදේශවල කටයුතු සිදු කිරීමට ඉතාමත් සුදුසුකම්ලත් සහ අත්දැකීම් සහිත කාර්යය මණ්ඩලය සේවයේ යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟවී තිබුණි. කෙසේවෙතත්, 2022 ජනවාරි 03 විගණිත දින වන විටත් ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් අනුයුක්ත කර නොතිබුණු බව ක්ෂේත්‍ර විගණනයේදී සිදුකරන ලද අහඹු පරීක්ෂාවේදී අනාවරණය වී තිබුණි. | මේවන විට උපදේශක විසින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන් සහ පොකුරු සම්බන්ධීකරණ නිලධාරීන් පත්කර ඇත. | -එම- |
| (iii) | ගොවි කණ්ඩායම් සංවර්ධන සැලසුම් 20කින් 2022 ජනවාරි 03 විගණිත දින වන විට එක ගොවි කණ්ඩායම් සංවර්ධන සැලැස්මක් පමණක් අනුමත කර තිබුණි. | ජාත්‍යන්තර සේවා සපයන්නා සමඟ එළඹි මුල් කොන්ත්‍රාත්තුව අනුව, සියලුම ගොවි කණ්ඩායම් සංවර්ධන සැලසුම් එකවර ඉදිරිපත් කළ යුතුවේ. සැලසුම් කළ පරිදි ATDPs ක්‍රියාත්මක කිරීම සහතික වීමේ අදහසින් තනි තනිව ගොවි කණ්ඩායම් සංවර්ධන සැලසුම් ඉදිරිපත් කිරීමට සහ භාර ගැනීමට දෙපාර්ශවය විසින් එකඟවිය. | -එම- |
| (iv) | ජාත්‍යන්තර සේවා සපයන්නන්ගේ කොන්ත්‍රාත් කාලපරිච්ඡේදය 2021 දෙසැම්බර් 31 දින කල්පිරුණද කොන්ත්‍රාත් කාලය, කාර්යසාධන බැදුම්කරයේ කාලය, අත්තිකාරම් ගෙවීම් සම්බන්ධ රක්ෂණය සහ බැංකු ඇපකරය දීර්ඝ කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | ජාත්‍යන්තර සේවා සපයන්නාගේ කොන්ත්‍රාත්තුවේ වලංගු කාලයට ජාත්‍යන්තර සේවා සපයන්නාගේ ගෙවීම් උප ලේඛනය සංශෝධනය කළ යුතු වන අතර ලේකම් විසින් 2022 ජනවාරි 31 දක්වා සංශෝධිත ගෙවීම් උපලේඛනය ඉදිරිපත් කිරීමට කාලය දීර්ඝ කර තිබුණි. එය සංශෝධනය කිරීමෙන් පසු 2023 ජුනි අවසානය දක්වා කාලය දීර්ඝ කිරීම් ලබා දෙමින් ජාත්‍යන්තර සේවා සපයන්නා විසින් ගිවිසුම අත්සන් කරනු ලැබේ. | කොන්ත්‍රාත් කාලය, කාර්සාධන බැදුම්කරය, අත්තිකාරම් ගෙවීම් සම්බන්ධ රක්ෂණය සහ බැංකු ඇපකරය දීර්ඝ කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (v) | පිරිවැය රු.මිලියන 2.99කට ප්‍රතිපත්ති අධ්‍යනයක් සිදුකර තිබුණද 2022 ජූනි 06 විගණිත දින වන විටත් සුදුසු ගොවි නිෂ්පාදන සංවිධාන පිළිබඳ අවසන් තීරණයකට එළඹ නොතිබුණු අතර මේවන විටත් ගොවි නිෂ්පාදන සංවිධාන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපනය කර තිබුණි. තවද, එම ගොවි සංවිධානවලට නීතිමය බැඳීමක්, ව්‍යවස්ථාවක් නොමැති අතර ඔවුන්ව සමාගම් රෙජිස්ටාර් විසින් පිළිනොගන්නා බව අනාවරණය විය. එමනිසා ව්‍යාපෘතියේ සහය අවසන් වූ පසු සියලුම ගොවි සංවිධාන කඩාවැටීමට ඉඩ ඇත. ව්‍යාපෘති සංකල්පයට අනුව ගොවි කණ්ඩායම්වල කටයුතු ක්‍රියාත්මක කිරීමට පෙර ගොවි නිෂ්පාදන සංවිධාන ආරම්භ කළ යුතුය. | ATDPs සඳහා වඩාත් සුදුසු ගොවි ව්‍යාපාර ආකෘතියක් හඳුනා ගැනීමට ප්‍රතිපත්ති අධ්‍යනයක් සිදු කරන ලදි. මෙම අධ්‍යනය ගොවි නිෂ්පාදන සංවිධානවල අඩුපාඩු පෙන්වා තිබුණු අතර මෙම අරමුණ සඳහා වෙනත් විකල්ප ඇගයීම් කර ඇත. සියලුම අවස්ථාවන් ඇගයීමෙන් පසුව ජාත්‍යන්තර සේවා සපයන්නා ගොවි කණ්ඩායම් සඳහා ලියාපදිංචි නොවූ පොදු සමාගම් ස්ථාපනය කිරීමට තීරණය විය | ව්‍යාපෘතියේ අරමුණු ලඟාකර ගැනීමට ව්‍යාපෘති ඇගයීම් ලේඛණවල සඳහන් අරමුණු සමඟ අනුගත වීමට පියවර ගත යුතුය. |
| (ආ) | 2018 ඔක්තෝබර් 28 දින රු.මිලියන 8.25ක ඇස්තමේන්තු ගත පිරිවැයකට ප්‍රතිලාභීන්ගේ තොරතුරු පද්ධතියක් සැලසුම් කිරීම, සංවර්ධනය, ස්ථාපනය සහ නඩත්තු කිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණු අතර 2019 පෙබරවාරි 27 වන විට නිමකිරීමට අපේක්ෂිත විය. පිළිවෙළින් 2019 සහ 2020 වර්ෂයේදී එකතුව රු.මිලියන 1.65ක් සහ රු. මිලියන 3.4ක් ගෙවා තිබුණද මාස 38ක් ගතවීමෙන් පසුව 2021 දෙසැම්බර් 30 විගණිත දින වන විටත් එම කටයුතු නිම කර නොතිබුණි. | සියලුම මොඩලයන් මෙම අධීක්ෂණ සහ ඇගයීම් තොරතුරු කළමනාකරණ පද්ධතියට ඇතුළත් කර ඇත. ආරම්භයේදී ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීමට අවශ්‍ය වූ අතර මෙම තොරතුරු කළමනාකරණ පද්ධතිය හරහා ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රගතිය සම්බන්ධ වාර්තා ලබාගත හැක. මෙයට අමතරව තොරතුරු කළමනාකරණ පද්ධතිය තුළ ජීවන චක්‍රය, ජීවන චක්‍රය නරඹන්නා යනාදි අමතර මොඩලයන් ඇතුළත් කර ඇත. වර්තමානයේ තොරතුරු කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක අතර ක්‍රියාකාරී සැලැස්ම ඇතුළත් කිරීමට සූදානම්වන අතර වාර්තා ලෙස ලබාගත හැකිවේ. ප්‍රගතිය මාසිකව ඇතුළත් කිරීමටද භාවිත කළ හැකිය. මෙය 2022 වර්ෂයේ සිදු කිරීමට නියමිතය. | කොන්ත්‍රාත්කරු විසින් සිදුකරන කටයුතු පිළිබඳ නියාමනය සහ අධීක්ෂණය සඳහා දැඩි සහ කාර්යක්ෂමව කොන්ත්‍රාත් පරිපාලන පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වේ. |
| (ඇ) | ගොවි ව්‍යාපාර පාසැල් පුහුණුව සහ ගොවි නිෂ්පාදන සංවිධාන පුහුණුව පිළිබද කොන්ත්‍රාත්තුව 2019 සහ 22020 වර්ෂවලදී රු.මිලියන 100.78ක ඇස්තමේන්තුගත පිරිවැයකට පිරිනමා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයේදී සේවා සපයන්නා වෙත එකතුව රු.මිලියන 50.2ක් ගෙවා තිබුණි. ලැබී තිබුණු තොරතුරු අනුව සේවා සපයන්නාගේ දුර්වල කළමනාකරණය, ගොවීන් තෝරා ගැනීමේ ක්‍රියාවලියේ පැවති අඩුපාඩු සහ | ගොවි ව්‍යාපාර පාසැල් පුහුණුව නියමු ගොවි කණ්ඩායම් සඳහා පවත්වා තිබුනු අතර එම වැඩසටහන්වල දිනකට පැය තුන බැගින් සැසි 31ක් ඇතුළත් විය. එම සැසි 31 නිමකිරීමේ අරමුණින් භෞතික පුහුණු වැඩසටහන් පවත්වා ඇත. දින 31ක දිගු කාලයක් වීම හේතුවෙන් දුර්වල පැමිණීම සහ වෙනත් සාමාජිකයින් සහභාගීවන බව මෙම සැසිවලදී | කොන්ත්‍රාත් ගිවිසුමේ අවශ්‍යතා සමඟ අනුකූල වීමට ජාත්‍යන්තර සේවා සපයන්නා පෙළඹවීමට පියවර ගැනීම අවශ්‍ය වේ. |

| | | | |
|---|---|---|---|
| | පුහුණු වැඩසටහන්වලට සහභාගීත්වයේ පැවති අඩුව හේතුවෙන් අපේක්ෂිත මට්ටමට පුහුණු වැඩසටහන් නිමකර නොතිබුණි. | දැනගන්නට ලැබුණි. කොවිඩ් - 19 ව්‍යාප්ත වීම හේතුවෙන් මෙම තත්ත්වය උග්‍ර විය. එමනිසා භෞතික පුහුණුවීම් සිදු කිරීමට නොහැකිවිය. | |
| (ඇ) | උතුරු මැද පළාතේ සිදුකරන ලද විගණන පරීක්ෂණයට අනුව මිරිස් වගාව සඳහා පිළිවෙලින් බොරවැව අක්කර 30ක්, නෙලුවැව අක්කර 25ක්, රත්මල්තැන්න අක්කර 03ක් සහ බෝගස්වැව අක්කර 15ක ඉඩම් තෝරාගෙන තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතිය ඉඩම් භාවිතය සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ ප්‍රතිලාභීන් අතර අවබෝධතා ගිවිසුමකට එළඹ නොතිබුණි. මේ කිසිවක් නොමැතිව ඉඩම් එළිපෙහෙළි කිරීම සහ සකස් කිරීමේ කටයුතු කොන්ත්‍රාත්තුව රු.මිලියන 16.2ක පිරිවැයකට පිරිනමා තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.මිලියන 77ක් ගෙවා තිබුණි. කෙසේවෙතත්, එම කටයුතු 2022 ජනවාරි 03 විගණිත දින වන විටත් නිමකර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | කොන්ත්‍රාත්කරු විසින් සිදුකරන කටයුතු පිළිබඳ නියාමනය සහ අධීක්ෂණය සඳහා දැඩි සහ කාර්යක්ෂමව කොන්ත්‍රාත් පරිපාලන පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වේ. |

**2.3 ඌන උපයෝජිත සම්පත්**

| විගණන ගැටලුව | කළමනාකරණයේ දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ලැබී තිබුණු තොරතුරු අනුව ව්‍යාපෘතියේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය මධ්‍යස්ථ මට්ටමක පැවතුණි. එමනිසා ණය මුදල් යටතේ කරන ලද රු.මිලියන 9,121.88කට සමාන එ.ජ.ඩො මිලියන 62.5 ප්‍රතිපාදනයෙන් ව්‍යාපෘතියේ කටයුතු ආරම්භකර වර්ෂ 5ක් ඉක්මවීමෙන් පසුව 2021 දෙසැම්බර් 31 දිනට මුළු ප්‍රතිපාදනයෙන් සියයට 50.9ක් නියෝජනය කරන රු.මිලියන 4,649.4කට සමාන එ.ජ.ඩො මිලියන 25.8ක් පමණක් උපයෝජනය කර තිබුණි. තවද, යුරෝපා සංගමයෙන් ප්‍රදානය කරන ලද යුරෝ මිලියන 25ක සහය ඇතිව 2020 වර්ෂයේදී බදුල්ල, කිළිනොච්චිය, අම්පාර සහ වව්නියාව ඇතුළුව ව්‍යාපෘතිය එහි භූගෝලීය ආවරණය ව්‍යාප්ත කර තිබුණි. කෙසේවෙතත්, මන්දගාමී අරමුදල් උපයෝජනය හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පවතින රාජ්‍ය ආයතන වෙත එකතුව රු.මිලියන 1,050ක් වෙන්කර තිබුණි. | විගණකාධිපතිගේ නිරීක්ෂණය පිළිගන්නා ලදි. මෙම ව්‍යාපෘතිය 2017 වර්ෂයේදී ආරම්භ කර තිබුණද, පාලනයෙන් පරිබාහිර හේතූන් නිසා සැලසුම් කළ පරිදි ව‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | අරමුදල් උපයෝජනයේ කාර්යක්ෂමතාවය වැඩි කිරීමට ව්‍යාපෘතියේ කටයුතු නිසි පරිදි සැලසුම් කළ යුතුය. |

## 2.4 පරිබාහිර කටයුතු

| විගණන ගැටලුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- |
| කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්යාලය සඳහා සුහුරු රූපවාහිනී යන්ත්‍රයක් මිලදී ගැනීමට සහ නිදහස් දින පුවත්පත් දැන්වීම පළකිරීම සඳහා ව්‍යාපෘතිය එකතුව රු.මිලියන 0.74ක් වැයකර තිබුණු බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘති පරිපාලන ලියකියවිලි ප්‍රතිපාදන අනුව ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ කොන්දේසියක් වේ. | ව්‍යාපෘතියේ මෙහෙයුම් පිරිවැය අවම කර ගැනීමට පියවර ගත යුතුය. |